


# 2048 වසර දක්වා සංවර්ධන මාවත

‘ නිදහසින් වසර 100 සපිරෙන 2048 වසර වෙද්දි සංවර්ධිත රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත් කරලීමේ අලුත් ප්‍රවේශයට හා අලුත් වැඩපිළිවෙලට පසුබිම මේ අයවැය යෝජනා මඟින් සකස් කෙරෙනවා ’

**2023 අයවැය කතාව 3.30 ඡේදය**

## 2024 whjefhy Wml ,mk

1. 2024 දී ආර්ථිකයේ 1.8% ක වර්ධනයක් අත්කර ගැනීම
2. උද්ධමනයේ සාමාන්‍ය අගය තනි ඉලක්කමක මට්ටමේ පවත්වා ගැනීම
3. විරැකියා මට්ටම 2024 දී 5% ට වඩා අඩු අගයක පවත්වා ගෙන යාම
4. විනිමය අනුපාතිකය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම
5. ආර්ථික වර්ධනය ප්‍රධාන වශයෙන් කර්මාන්ත, කෘෂිකර්මය සහ සංචාරක ක්ෂේත්‍ර මෙන්ම ප්‍රේෂණ මගින් මෙහෙයවීම



# අයවැය සාරාංශය - 2024

| කාණ්ඩය | 2024 ඇස්ත. රු.බි |
|---|---|
| **ආදායම** | **4,127** |
| බදු ආදායම | 3,820 |
| බදු නොවන ආදායම | 287 |
| ප්‍රදාන | 20 |
| **මුළු වියදම** | **11,283** |
| පුනරාවර්තන වියදම | 5,299 |
| ප්‍රාග්ධන වියදම | 1,710 * |
| ණය මුදලේ ආපසු ගෙවන කොටස | 4,268 |
| අත්තිකාරම් ගිණුම | 6 |

✶ බැංකු ප්‍රාග්ධනීකරණය ද ඇතුළත්ව

** 2024 අයවැය ඇස්තමේන්තු අනුව සකස් කර ඇත*

# 2024 වර්ෂය තුළ රජයට ආදායම් ලැබෙන ආකාරය

රු.බිලි

| *කාණ්ඩය* | *2024-ඇස්ත* |
|---|---|
| විදේශ වෙළඳාම මත බදු | 505 |
| දේශීය වෙළඳ හා සේවා මත බදු | 2,235 |
| ආදායම් හා ලාභාංශ මත බදු | 1,080 |
| බදු නොවන ආදායම මත බදු | 287 |
| ප්‍රදාන | 20 |
| ***එකතුව*** | ***4,127*** |

** 2024 අයවැය ඇස්තමේන්තු අනුව සකස් කර ඇත*

# සමාජ ආරක්ෂණ ජාල

- 2002 සුබසාධන ප්‍රතිලාභ පනත නිසි ලෙස ක්‍රියාත්මක කිරීම
- සියලුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම ආවරණය වන පරිදි ලියාපදිංචි කිරීමේ ලේඛණය යාවත්කාලීන කිරීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ණය යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන අවිධිමත් ගෘහාශ්‍රිත ව්‍යාපාරවල නියැලී සිටින තරුණ කාන්තා ව්‍යවසායිකාවන් හට නව ණය යෝජනා ක්‍රමයක් මඟින් ප්‍රතිලාභ ලබා දීම
- කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන හරහා ගොවීන් කෘෂි ව්‍යවසායකයින් බවට පත් කර වැඩි රැකියා අවස්ථා ඇති කිරීම.
- ළමුන්ගේ පෝෂණය ඉහළ නැංවීම සඳහා දැනට පවතින වැඩසටහන් ශක්තිමත් කිරීම
- සමාජ ආරක්ෂණ ආයතන, බෙදාහැරීමේ පද්ධති සහ ඉලක්ක කිරීම ශක්තිමත් කිරීම
- ගෘහාශ්‍රිත ව්‍යවසායකයින් ලෙස වැඩිහිටි, ආබාධිත සහ වැන්දඹු ප්‍රජාවගේ කුසලතා උපයෝජනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන වියදම් ප්‍රතිපාදන

# අධ්‍යාපන

- විස්තීරණ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කිරීම
- කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යටතේ සීතාවක විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය, කුරුණෑගල තාක්ෂණ විශ්වවිද්‍යාලය, කළමනාකරණ හා තාක්ෂණ විශ්වවිද්‍යාලය, දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය යන නව විශ්වවිද්‍යාල හතරක් පිහිටුවීම.
- පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන එනම් NSBM, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, හොරයිසන් කැම්පස් සහ රෝයල් ඉන්ස්ටියුට් යන ආයතන විශ්වවිද්‍යාල බවට පරිවර්තනය කිරීම
- ඉන්දියාවේ චෙන්නායි හි IIT විශ්වවිද්‍යාලයේ මඟපෙන් වීම යටතේ මහනුවර නව තාක්ෂණ විශ්වවිද්‍යාලයක් පිහිටුවීම.
- රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් සඳහා වාණිජ බැංකු මඟින් සහනාධාර ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය
- සුරක්ෂා ශිෂ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය නැවත හඳුන්වා දීම
- ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීම
- ජාතික නිපුණතා කොමිෂන් සභාව පිහිටුවීම


# වෙනත්

- පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා සුදුසු පරිදි ආහාර සහ නවාතැන් දීමනාව සකස් කිරීම
- 2024 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම රාජ්‍ය සේවකයන් සඳහා පෙර ලෙසම ආපදා ණය පහසුකම ලබා දීම.
- විවිධ නාගරික සංවර්ධන වැඩසටහන් යටතේ ඉදිකරන ලද සහ දැනට අඩු ආදායම්ලාභී පවුල් සඳහා කුලියට ගෙන ඇති නිවාසවල සම්පූර්ණ අයිතිය ලබා දීම.
- විමධ්‍යගත අයවැය වෙන් කිරීමේදී සහ විදේශ ණය ලබා ගැනීමේදී පානීය ජල ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දීම.
- වෛද්‍යවරුන් සඳහා පවතින පශ්චාත් උපාධි අවස්ථා පුළුල් කිරීම
- ඉන්දියානු ආයෝජකයින් සමඟ එක්ව ත්‍රිකුණාමල නගර සංවර්ධන වැඩසටහන දියත් කිරීම සහ මෙම කටයුතු සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවීම.
- දේශීය වෛද්‍යකම ශක්තිමත් කිරීම සහ ප්‍රචලිත කිරීම
- කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වගකීම් ඒ ඒ ප්‍රදේශවල ගොවි සංවිධාන වෙත පැවරීම.
- කිරි නිෂ්පාදන වටිනාකම් දාමයේ නියැලී සිටින අයගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රති-මූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- පසුබෑමෙන් ගොඩ ඒම සඳහා ඉදිකිරීම් කර්මාන්තයට සහාය වීම සඳහා නව අත්හදා බැලීම් සිදු කිරීම

# 2024 වසර සඳහා රු. බිලියන 445 ක්



| රු. බිලියන 9.0 | රු. බිලියන 109 | රු. බිලියන 327 |
|---|---|---|
| වරාය සහ ගුවන් සේවා | ප්‍රවාහනය | මාර්ග සංවර්ධනය |



**වරාය සහ ගුවන් සේවා**
**රු. බිලියන** 9.0

| | |
|---|---|
| වරාය සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | **රු. බිලියන** 6.4 |
| හිඟුරක්ගොඩ ගුවන් තොටුපල සංවර්ධනය රු. බිලියන 2.0 | |
| ආයතනික සහාය | **රු. බිලියන** 0.6 |



**ප්‍රවාහනය**
**රු. බිලියන** 109

- දුම්රිය මැදිරි, එන්ජින් සහ දුම්රිය ආශ්‍රිත යටිතල පහසුකම් නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම - **රු. බිලි 10.8**
- ලංගම බස් ඇණිය නඩත්තු කිරීම – **රු. බිලි 1.5**
- හිඟ බිල්පත් පියවීම සහ දැනටමත් ආරම්භ කර ඇති දුම්රිය මාගර් සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවධර්නය අඛණ්ඩව පවත්වාගෙන යාම – **රු. බිලි 32**
- E-මෝටර් ව්‍යාපෘතිය - **රු. බිලි 1.0**
- අදාළ ආයතන සඳහා ආයතනික සහාය (SLR ඇතුළුව වැටුප් සහ වැටුප්, SLR වෙත ඉන්ධන සහ අනෙකුත් පුනරාවතර්න) – **රු. බිලි 33.1**
- නව බස් රථ ලබා දීමෙන් ලංගම බස් රථ ඇණිය ශක්තිමත් කිරීම – **රු. බිලි 3.2**
- බස් පාස්, සමාජීය වශයෙන් අනිවායර් බස් සේවා සහ අනෙකුත් සුභසාධනය අඛණ්ඩව පවත්වාගෙන යාම - **රු. බිලි 14.9**
- මාර්ග ආරක්ෂාව ස්ථාවර කිරීම – **රු. බිලි 1.2**
- මහනුවර බහුවිධ ප්‍රවාහන පයර්න්තයේ ඉදිකිරීම් අඛණ්ඩව සිදු කිරීම – **රු. බිලි 11.3**

# 2024 වසර සඳහා රු. බිලියන 194



නාගරික සංවර්ධන හා නිවාස

**රු. බිලියන 73.5**



ජල සැපයුම

**රු. බිලියන 120.2**


## නාගරික සංවර්ධන හා නිවාස - රු බිලියන 73.5

| | රු. බිලියන |
|---|---|
| නාගරික සංවර්ධනය | 8.7 |
| ග්‍රාමීය හා අර්ධ නාගරික යටිතල පහසුකම් | 32.1 |
| නිවාස සංවර්ධනය | 28.5 |
| වතු ජනතාව සඳහා ඉඩම් අයිතිය ලබා දීම | 4.0 |

## ජල සැපයුම - රු. බිලියන 120.2

| | රු. බිලියන |
|---|---|
| ජලසම්පාදන යෝජනා ක්‍රම සංවර්ධනය | 75.2 |
| ජලසම්පාදන යෝජනා ක්‍රමවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම | 13.8 |
| ජලසම්පාදන ක්‍රමවල ධාරිතාව ඉහළනැංවීම | 10.0 |
| සනීපාරක්ෂාව / අපජල බැහැර කිරීම සංවර්ධනය | 11.6 |
| ග්‍රාමීය හා ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම සංවර්ධනය | 9.6 |

# වෘත්තිය අනුව ජාතික සහ පළාත් මට්ටමින් රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව




- දීපව්‍යාප්ත සේවයේ විධායක කාර්ය මණ්ඩලය - 12"314
- වෛද්‍ය නිලධාරීන් - 24"189
- හෙද නිලධාරීන් - 28"584
- වින්නඹු මාතාවන් - 8"949
- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු - 2"350
- ගුරුවරු - 224"859
- සංවර්ධන නිලධාරීන් - 92"962
- කළමනාකරණ සේවා නිලධාරීන් - 37"313
- ග්‍රාම නිලධාරීන් - 10"288
- සමෘද්ධි සංවර්ධන නිලධාරීන් - 20"373
- කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් - 7"418
- ආරක්ෂක පිරිස් - 230"268
- පොලිස් නිලධාරී / විශේෂ කාර්ය බළකාය (නිල ඇඳුම් සේවක සංඛ්‍යාව) - 85"427
- සිවිල් ආරක්ෂකයින් - 26"030
- තැපැල් (දෙපාර්තමේන්තු) - 19,292
- රියදුරු සේවය - 8"722
- කාර්යාල කාර්ය සහයක සේවය - 19"243
- බහුකාර්ය සංවර්ධන කාර්යාල සහායක - 29"710
- දුම්රිය (දෙපාර්තමේන්තු) - 13"964
- අනෙකුත් - 249"909

*කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

